# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

04 වසර / Grade 04

**පාලි** කාලය : පැය තුන යි

**PALI** Time : Three Hours

**I** කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද **II** කොටසින් **02 හා 06 ප්‍රශ්න** ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න **05කට පමණක්** පිළිතුරු සපයන්න.

---

**I කොටස**

01. කෙටි පිළිතුරු සපයන්න.

I. 'වග්ගා පඤ්ච පඤ්චසො මන්තා' යන සූත්‍රයෙන් කියවෙන අදහස පැහැදිලි කරන්න.

II. උපසර්ග පද යන්නෙන් අදහස් කරනුයේ කවර පද විශේෂයක් ද?

III. '**ගුත්තිලො ආචරියො** මූසිලං එතදවොච'. මෙම වැකියෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙක සමාස කර යොදා එම වාක්‍යය නැවත ලියන්න.

IV. 'භගිනී + ණෙය්‍ය' යන්නෙන් සැදෙන තද්ධිත පදය ලියා දක්වන්න.

V. 'ගච්ඡන්ත, පචමාන' යන පදයන්හි යෙදී ඇති කිතක ප්‍රත්‍යයන් පිළිවෙළින් ලියා දක්වන්න.

VI. 'එවං + අස්ස = එවමස්ස' මෙම පදය සන්ධි වූ අයුරු බාලාවතාර සූත්‍රානුසාරයෙන් පෙන්වා දෙන්න.

VII. රසවාහිනී කෘතියේ කතුවරයා හා කාලය නම් කරන්න.

VIII. ජිනචරිතයේ ගාථා ප්‍රමාණය නම් කොට එයින් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.

IX. ධාතුමඤ්ජූසා කෘතියෙහි කර්තෘ හා කාලය ලියා දක්වන්න.

X. පාලි අක්ෂර මාලාව 43 ක් ලෙස දක්වන ව්‍යාකරණ සම්ප්‍රදාය නම් කොට, එලෙස දැක්වීමට හේතුව පෙන්වා දෙන්න.

(ලකුණු 4 × 10 = 40 යි)

**II කොටස**

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට පරිවර්තනය කරන්න.

සො අපරභාගෙ ආරඤ්ඤකමහාභයත්ථෙරොති පාකටො අහොසි. අථෙකස්මිං සමයෙ එකො උපාසකො තං උපසංකමිත්වා වන්දිත්වා ධම්මං සුත්වා පසන්නමානසො තං යාචිත්වා ද්වාදසසංවච්ඡරානි ***පච්චයෙහි*** චතූහි පටිජග්ගි. සො ථෙරස්ස ***චීවරත්ථාය*** කාලෙන කාලං සාටකං දෙති. දින්නදින්නානි සාටකානි තස්සෙව අන්තරගෙහෙ හරන්තිකො නාමෙකො චොරො රත්තියං ගන්ත්වා හරති.

(ලකුණු 06 යි)

(ආ) ඉහත ඡේදයේ අංකිත (ඉරි ඇඳි) පදවල විභක්තිය හා එම පදවල විභක්ති අර්ථ පෙන්වා දෙන්න.
උදා :- සාටකං - දුතියා විභක්තිය, කර්මාර්ථය

(ලකුණු 04 යි)

(ඇ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

I. ඒ රජතුමා ඇමතියා සමඟ ගමින් ගමට යයි.

II. එකල වන ලැහැබෙහි මහා නාගයෙක් වාසය කළේය.

III. නිදි මරන්නාට රැය දිග ය.

IV. මම හෙට රථයෙන් ගමෙන් නගරයට යන්නෙමි.

V. නුඹ ගමට යන්නේ නම් මැනවි. (ලකුණු 05 යි)

03. (අ) පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කර ඒ ඒ පද කුමන සන්ධි වර්ගයට අයත්දැයි සඳහන් කරන්න.
I. චන්දොදයො II. ස්වාක්ඛාතො III. ආයුක්ඛයො IV. චක්කංව V. විදූනග්ගං (ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන ඡේදයෙහි අඩංගු විසන්ධි පද 05 ක් සන්ධි කර ඡේදය නැවත ලියා දක්වන්න.

සා එවං වත්වා අපි තාය පුනං පුනං යාචමානා අද්ධා මතො භවිස්සති ඉති සම්පටිච්ඡිත්වා තාය සද්ධිං පායාසි. ගච්ඡන්තී අපි පන කො ජානාති කිං භවිස්සති ඉති තස්මිං ආසඞ්කාය සිගාලිං පුරතො කත්වා සිගාලං පරිගණ්හන්තී එව ගච්ඡති.

(ලකුණු 05 යි)

04. (අ) සමාස ප්‍රභේද සියල්ල නම් කරන්න. (ලකුණු 06 යි)

(ආ) පහත දැක්වෙන පද කුමන සමාස වර්ගයකට අයත්දැයි නම් කරන්න.
I. බ්‍රාහ්මණදාරිකා II. මාතාපිතරෝ III. උපනගරං (ලකුණු 06 යි)

(ඇ) කම්මධාරය සමාසයේ ප්‍රභේද 03 ක් නම් කොට ඒවාට උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 03 යි)

05. (අ) ඉකාරාන්ත ඉත්ථිලිංග 'යුවති' ශබ්දය හෝ උකාරාන්ත පුල්ලිංග 'භානු' ශබ්දය හෝ සියලු විභක්තිවල වරනගා වගුගත කර දක්වන්න. (ලකුණු 10 යි)

(ආ) √**පච** ධාතුව සත්තමී ආඛ්‍යාත පරස්සපදයෙහි පුරුෂත්‍රයේ වරනගා වගුගත කොට දක්වන්න.
(ලකුණු 05 යි)

06. (අ) පහත සඳහන් ඡේදය සිංහලට පරිවර්තනය කරන්න.

භගවති ධරමානෙ ලංකායං නාගදීපෙ චූලොදර මහොදරොති ද්වෙ මාතුලභාගිණෙය්‍යා මණිපල්ලඞ්කස්ස කාරණා සඞ්ගාමං පච්චුපට්ඨාපෙසුං.

(ලකුණු 04 යි)

(ආ) පහත සඳහන් ගාථා සිංහලයට පරිවර්තනය කරන්න.

සොධෙන්ත'මඤ්ජසං දිස්වා - ඔතරිත්වා නභා තහිං
ඉති තං ජනතං පුච්ඡි - කස්මා සොධෙථ අඤ්ජසං

මහියා පංසුතො චා'පි - සමුද්දොදකතො'ධිකං
දදං සරීරමංසං ච - ලොහිතම්පි ච අත්තනො

(ලකුණු 2.5 × 2 = 05 යි)

(ඇ) ගිහි - පැවිදි දෙපිරිස ම සුමඟට යොමු කිරීමට රසවාහිනියෙන් ලැබෙන පිටුබලය කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

**නැතහොත්**

'බුදු සිරිත ඉගෙනීමට අගනා කෘතියකි, ජිනචරිතය.' මෙම කියමන සනිදර්ශන ව පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

07. (අ) **නමො යොගෙ චතුත්ථී** සහ **අපාදානෙ පඤ්චමී** යන සූත්‍ර දෙකෙහි අදහස සනිදර්ශන ව පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(ආ) පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.
I. එරාවණො පුණ්ඩරීකො ....
II. මෙඝො වළාහකො දෙවො ....
III. සිඳ සිඞ්ගාර පාකෙසු ....
IV. ගුප ගොපනකෙ ගුප සංවරණෙ ....
(ලකුණු 2 × 4 = 08 යි)

08. (අ) ගන්තබ්බ, සාරාණීය, හාරිය, මත, ගාරය්හ යන පදවල කෘදන්ත ප්‍රත්‍යයන් වෙන් කර දක්වන්න.
(ලකුණු 1 × 5 = 05 යි)

(ආ) ණාන, ණෙය්‍ය, ඉම, ඉට්ඨ, මන්තු යන ප්‍රත්‍යය යොදා තද්ධිත පදය බැගින් සාදන්න.
(ලකුණු 5 × 2 = 10 යි)